### 7. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

අඤ්ඤමඤ්ඤපච්චයොති යන ප්‍රත්‍යයොද්දේශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය, ප්‍රත්‍යයෝත්පන්න , ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති.

ඔවුනොවුන්ට උපකාර වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති නාම ස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට උපකාර වන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසංඥ සත්ත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හෘදය වස්තුව ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොහු **අඤ්ඤමඤ්ඤ** ප්‍රත්‍ය වන ධර්මයෝ ය.

අන්‍යොන්‍ය වශයෙන් උපකාර ලබන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ගේ උපකාරය ලබන සකල මහාභූතයෝ ය, හෘදය වස්තුවෙන් උපකාර ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුවය යන මොවුහු **අඤ්ඤමඤ්ඤ** ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍ය ලබන චිත්තජ රූපයෝ ය, හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍ය ලබන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසංඥ සත්ත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ උපාදාය රූපයෝ ය යන මොහු **අඤ්ඤමඤ්ඤ** ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝ ය.

------------------------------------------------------------------

**අඤ්ඤමඤ්ඤපච්චයො** - අඤ්ඤමඤ්ඤ යන්නෙහි 'අඤ්ඤ' යනු ලිඞ්ගය යි (තනි පදය යි). 'සි' විභක්තිය තබා එයට 'අං' ආදේශ කොට, අඤ්ඤං යැයි සිද්ධ වේ. අනතුරුව "සබ්බාදීනං වීතිහාරෙ" යන මොග්ගල්ලාන සූත්‍රයෙන් 'අඤ්ඤංඅඤ්ඤං' යැයි ද්විරූපයක් කොට, පෙර පදයෙහි 'අං' ලොප් කොට, මකාරාගාමයෙන් "අඤ්ඤමඤ්ඤං" යන පදය සිද්ධ වේ. අඤ්ඤමඤ්ඤං - අන්‍යොන්‍ය, හුත්වා - වෙමින්, පච්චයො - උපකාරක ශක්තිය, අඤ්ඤමඤ්ඤපච්චයො - අඤ්ඤමඤ්ඤ පච්චය නම් වේ. පාද තුනකින් සාද ඇති බංකුවක පාද තුන එකිනෙකට උපකාර කරයි. එක් පාදයක් කැඩුණහොත් සෙසු පාද දෙකින් උපකාර කිරීමට, දරා ගැනීමට නොහැකි වන්නා සේ තමා හා සමග පහළ වන්නා වූ ධර්මයන් එකිනෙකට උපකාර කරන්නා වූ ශක්තිය අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය නම් වේ.

**ප්‍රත්‍යය** - "ඔවුනොවුන්ට උපකාර වන එකුන් අනූ චිත්තය ය" ආදී වශයෙන් ප්‍රත්‍යයන් සඳහා කියන ලද වාක්‍ය කණ්ඩයන් තුන "1. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං, 2. මහාභූතා අඤ්ඤමඤ්ඤං, 3.

පටිසන්ධික්ඛණෙ වත්ථුවිපාකා අඤ්ඤමඤ්ඤන්ති ච තිවිධො හොති' යන අභිධර්මාර්ථ සංග්‍රහ පාඨයේ පරිවර්තනය යි.

**ප්‍රත්‍යයෝත්පන්න** - "අන්‍යොන්‍ය වශයෙන් උපකාර ලබන" යන්නෙහි අදහස සහජාත ප්‍රත්‍යයේ කී ආකාරයෙන් දතයුතු වේ. ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නයන්හි ආකාරය සහජාත ප්‍රත්‍යයේ ක්‍රමයෙන් දතයුතු වේ.

**ප්‍රත්‍යනීක** - "නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ රූපයෝ ය හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය" යන තැන ප්‍රවෘත්ති කාලයේ දී පඤ්චවෝකාර භවයෙහි චිත්ත චෛතසික සහ චිත්තජ රූප පහළ වන විට දී, නාම ස්කන්ධයෝ අන්‍යොන්‍යව ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න බවට පත් වනුයේ නමුදු චිත්තජ රූපයෝ ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න බවට පත් නො වෙති. සහජාතව පහළ වන්නා වූ නාමස්කන්ධයන්ගෙන් උපකාරය ලබන්නා වූ චිත්තජ රූපයෝ ප්‍රත්‍යනීකයෝ වෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් සහ කර්මජරූපයන් පහළ වන විට දී, නාමස්කන්ධයෝ සතර දෙන එකිනෙකට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න වෙත්. එම ප්‍රතිසන්ධි ස්කන්ධයන් හා සහජාතව පහළ වන හදය වස්තුව හැර සෙසු කර්මජ රූපයෝ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නවලට ඇතුළත් නොවී ප්‍රත්‍යනීකවලට ඇතුළත් වේ. "ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ප්‍රත්‍ය ය, - හදය වස්තුව ප්‍රත්‍යයෝත්පන්න ය, හදය වස්තුව ප්‍රත්‍ය ය - නාමස්කන්ධ සතර ප්‍රත්‍යයෝත්පන්න ය" යනුවෙන් ප්‍රත්‍ය ප්‍රත්‍යෝත්පන්න තුළ ඇතුළත් වේ.

"මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ" යනුවෙන් දක්වන ස්ථානයෙහි චිත්තජ උපාදා රූප, ප්‍රතිසන්ධි කර්මජ උපාදා රූප ආදී වශයෙන් 'උපාදා රූප' යන පදය සමඟ සම්බන්ධ කරගන්න. චිත්තජ කලාපයන් පහළ වන සෑම අවස්ථාවක දී ම මහාභූතයෝ සතරදෙන එකිනෙකට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න වේ. ඒ මහාභූත සතරෙන් උපකාර ලබන සහජාතව පහළ වන්නා උපාදා රූපයෝ ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නයන්හි ඇතුළත් නොවී ප්‍රත්‍යනීකවල පමණක් ඇතුළත් වෙති. ප්‍රතිසන්ධි කර්මජ උපාදරූප ආදියෙහිදී ද "කර්මජ කලාපයෙහි මහාභූතයෝ එකිනෙකට ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න වේ, ඒ කර්මජ මහාභූතයන්ගෙන් උපකාර ලබන සහජාතව පහළ වන්නා වූ උපාදරූපයෝ ප්‍රත්‍යනීක ය" යන ආදී වශයෙන් දතයුතු වෙත්.

දක්වන ලද වචනයට අනුකූලව චිත්ත චෛතසිකයන්ගේ සහජාත ශක්තිය චිත්තජ රූපයන්හි පවතිනුයේ නමුදු අඤ්ඤමඤ්ඤ ශක්තිය නොපවතියි. මහාභූතයන්ගේ සහජාත ශක්තිය උපාදරූපයන්හි පවතිනුයේ නමුදු අඤ්ඤමඤ්ඤ ශක්තිය නො පවතියි. මෙසේ ගත් කල සහජාත ශක්තියේ විෂයපථය පුළුල් වන අතර අඤ්ඤමඤ්ඤ ශක්තියේ විෂය පථය පටු වීම

නිසා සහජාත ප්‍රත්‍යය උපදින වාරයක් පාසා අඤ්ඤමඤ්ඤ ශක්තිය නොමැති වීම හේතුවෙන් "සහජාතාදිපච්චයො හොන්තොයෙව හි කොචි අඤ්ඤමඤ්ඤපච්චයො න හොති" යනුවෙන් මූලටීකාවෙහි වදාළහ.